www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*ශ්‍රී ලංකාව:*

# බැල්මොරල් වතුයායේ ක්‍රියාකරී කමිටුවෙහි දේශපාලන වැදගත්කම

## The political significance of the Balmoral Estate Action Committee

**2009 සැප්තැම්බර් 29**

බැල්මොරල් තේ වතුයායේ කම්කරුවන් විසින්, වෘත්තීය සමිති වලින් ස්වාධීනව ඔවුන්ගේම ක්‍රියාකාරී කමිටුව ගොඩනැඟීමට ගත් දිරිමත් පියවර, දිවයිනේ ද ජාත්‍යන්තරව ද කම්කරුවන් සඳහා පුලුල් දේශපාලනික වැදගත්කමක් දරා සිටියි.

දශක ගනනාවක් පුරා වෘත්තීය සමිති පිලිබඳව කම්කරුවන් ලබා ඇති අමිහිරි අත්දැකීම්වල කූටප්‍රාප්තිය සලකුනු කල, ආන්ඩුව හා වතු අධිකාරීන් සමඟ අත්වැල් බැඳගෙන ලංකා කම්කරු කොංග්‍රසය නොහොත් සීඩබ්ලිව්සී විසින් මෑතක දී ඇටවූ දරිද්‍රතා මට්ටමේ වැටුප් ගිවිසුම, කෙරෙහි පලවූ දැඩි කෝපය, ඔවුන් ගත් තීන්දුවට මූල් විය. බැල්මොරල් වතුයායේ ක්‍රියාකාරී කමිටුව සියලු කම්කරුවන්ගෙන් කල ඉල්ලීමෙහි, ගිවිසුමට විරුද්ධ බව පවසන සමිති ද ඇතුලු සියලු වෘත්තීය සමිති කෙරෙහි තමන්ට කිසිදු විශ්වාසයක් නොමැති බව ප්‍රකාශ කරයි. 2006 වසරේ පැවති තමන්ගේ අවසන් වැටුප් අරගලය පාවාදීම තුල ඔවුන් ඉටුකල භූමිකාව පිලිබඳව ද එය සඳහන් කරයි.

සමාජවාදී සමානතා පක්ෂයේ දේශපාලන සහයෝගය ද ඇතිව බැල්මොරල් වතුයායේ කම්කරුවෝ, අනෙකුත් වතුවල කම්කරුවන් ද තමන්ගේ ක්‍රියාකාරී කමිටු ගොඩනගමින් ඉල්ලීම් මාලාවක් කෙටුම්පත් කර ගැනීම සඳහා ද ඒ වෙනුවෙන් සටන්වැදීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ගැනීමට ද සමුලුවක් සූදානම් කිරීම සඳහා මූලිකත්වය ගතයුතු යයි උද්ඝෝෂනයක නිරතව සිටිති. තමන් හමුවේ ඇති දේශපාලන අරගලය, හුදෙක් හාම්පුතුන්ට හා ආන්ඩුවට පමනක් නොව, සියල්ලටත් වඩා කම්කරු පන්තියේ කවර හෝ ස්වාධීන අරගලයක් කඩාකප්පල් කිරීම සඳහා පසුබට නොවන වෘත්තීය සමිති වලට එරෙහිව ද සිදුවන්නක් බව ක්‍රියාකාරී කමිටුව මනාව වටහාගෙන සිටියි.

වතු කම්කරුවන් මුහුනපා ඇත්තේ ලොව වටාම කම්කරු පන්තිය මුහුනපා සිටින එම තත්ත්වයන්ට ම ය. 1930 ගනන් වලින් පසුව ධනේශ්වර පද්ධතියේ ඇතිව තිබෙන ගැඹුරු ම අර්බුදය මධ්‍යයේ වැටුප්, වැඩ පැය ගනන්, රැකියා හා ජීවන තත්ත්වයන් කප්පාදුව තුලින් කම්කරු පන්තිය එහි බරට කර ගැසිය යුතු යයි ආන්ඩු හා හාම්පුතුන් වැඩ කරන ජනතාවට බලකර සිටියි. තේ දලු නෙලන හා අනෙකුත් කම්කරුවන්ට දිනකට රුපියල් 405 ක් නැතහොත් ඇ.ඩොලර් 3.50 කට වඩා ගෙවීමට නොහැකි බව කියා සිටින ශ්‍රී ලංකාවේ වතු සමාගම් මෙන්ම එක්සත් ජනපදයේත්, යුරෝපයේ හා ජපානයේත් මෝටර් රථ කර්මාන්තයේ යෝධ සමාගම්, එම හඬම නංවමින් කියා සිටින්නේ තම කම්කරුවන් ද චීනයේ හා ආසියාවේ වහල් ශ්‍රම තත්ත්වයන් පිලිගත යුතු බවයි.

කෙසේ වෙතත්, බැල් මොරල් වතු යායේ ක්‍රියාකාරී කමිටුව සිය ආයාචනය තුල මෙසේ ප්‍රකාශ කරයිඃ " ආර්ථික බිඳ වැටීමට වගකිව යුත්තේ අප නොවේ. අරාජික ලාභ පද්ධතිය මඟින් නිර්මිත අර්බුදයේ බරට අප කර නොගැසිය යුතුය. අප අත්වැල් බැඳගත යුත්තේ අපගේ අවශ්‍යතාවන් ඉටුකරගත හැකි ආකාරයේ සමාජවාදී සමාජයක් ප්‍රතිනිර්මානය කිරීමට සටන් වැදීම සඳහා අවශේෂ කම්කරුවන් සමඟ මිස ධනපති අතලොස්සක් දෙනා සමඟ නොවේ. සියල්ලටත් වඩා සමාජයේ සියලු ධන සම්පත්වල සැබෑ නිර්මාපකයන් වන්නේ කම්කරුවන්ය."

ඒ සමඟම, මෙරට වෘත්තීය සමිති පිලිබඳව වතු කම්කරුවන්ගේ අමිහිරි අත්දැකීම්, ජාත්‍යන්තර කම්කරු පන්තිය විසින් ද අත්විඳිනු ලබයි. සිය මූලික අයිතීන් ආරක්ෂාකර ගැනීම සඳහා අතීතයේදී කම්කරු පන්තිය විසින් ගොඩනඟාගත් සංවිධාන දැන්, වැටුප් කප්පාදුවටත්, රැකියා ආරක්ෂා කිරීමේ කුමන හෝ අරගලයක් කඩාකප්පල් කර ව්‍යාපාරික ලාභ ඉහල නැංවීම සඳහාත් හාම්පුතුන් හා ආන්ඩු සමඟ එලිපිටම පෙලගැසී සිටිති. වෘත්තීය සමිති, රාජ්‍ය පද්ධතිය හා ව්‍යාපාරික ප්‍රභූ පැලැන්තිය තුලට වඩ වඩාත් කාවැදෙමින් තිබේ. දේශපාලන පක්ෂ ලෙස ද කටයුතු කරන ශ්‍රී ලංකාවේ වතු සමිතිවල නායකයෝ ඒ අතර වාරයේ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ කැබිනට්ටුවෙහි ද වාඩිගෙන සිටිති. එක්සත් ජනපදයේ දී, ජෙනරල්

මෝටර්ස් හා ක්‍රයිස්ලර් සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමට සහාය දීම තුලින් රථවාහන වෘත්තීය සමිති දැන් ඒවායේ ප්‍රධාන කොටස් අයිතිකරුවන් බවට පත්ව සිටියි.

වෘත්තීය සමිති පාලක පන්තිය වෙනුවෙන් කටයුතු කරන කාර්මික පොලිස්කාරයන් බවට පරිවර්තනය වීමේ මෙම ක්‍රියාදාමය, පසුගිය දශක තුන තුල සමාජයේ ආර්ථික පදනමෙහි ඇතිව තිබෙන ප්‍රගාඪ වෙනස්කම් වල ප්‍රතිපලයකි.

වෘත්තීය සමිති හරහා හාම්පුතුන්ගෙන් මෙන්ම ආන්ඩුවලින් මූලික සහන වුවත් මිරිකා ගැනීමේ හැකියාව කම්කරුවන්ට ලබාදුන්නේ නිෂ්පාදනය ජාතික රාජ්‍ය තුල මුල්බැස තිබීමේ කාරනය මත ම පමනි. එහෙත්, 1970 ගනන් අග භාගයෙන් ඉක්බිත්තෙහි නිෂ්පාදන ක්‍රියාවලීන්හි සිදුවූ ගෝලීය ඒකාග්‍රකරනය, ජාතික ආර්ථික නියාමනය මත පදනම්වූ සියලු පක්ෂ, සංවිධාන හා ක්‍රියාමාර්ග වල පල්ලට යවා තිබේ. කුමන ආකාරයකින් හෝ වැඩ කරන ජන සමූහයේ ජීවිතය සුව පහසු කර දීම කෙසේ වෙතත්, වෘත්තීය සමිති දැන් ක්‍රියා කරන්නේ තම ශ්‍රම බලකාය වෙතින් නිමක් නැති සහන ව්‍යාපාර වෙනුවෙන් මිරිකා දීම සඳහාය.

කෙන්යාවේ හෝ ඉන්දියාවේ තේ දලු නෙලන කම්කරුවන් සමඟ ගත් කල සිය කම්කරුවන්ගේ තරඟකාරී ශක්තිය අඩු බවට වතු සමාගම් නඟන කෙඳිරිය ලොව පුරාම කම්කරුවන්ට හුරු පුරුදු ය. ශ්‍රී ලංකාවේ සිය දුගී ශ්‍රමිකයන්ට දිනකට ඩොලර් 3.50 ක් පවා ගෙවීමට නොහැකි බවට ව්‍යාපාරිකයන්ගෙන් නැඟෙන කන් කෙඳිරිය විකාරයක් සේ පෙනී යා හැකිය. එහෙත් මෙහි නොවරදින සුලු තර්කනයක් ගැබ්ව තිබේ. "ජාත්‍යන්තරව තරඟකාරීවීම" යන්නෙහි අර්ථය, එක දිගට වියදම් කැපීම හා පලදායිතාවය නැංවීමේ දිසාවට කෙරෙන නොනවතින ධාවනයයි. ලොව පුරා බොහොමයක් තැන්වලදී මෙන්ම ශ්‍රී ලංකාවේ වතුකරය තුල ද ඇතිකරගෙන තිබෙන වැටුප් ගිවිසුම නිෂ්පාදනයටත් මිල හා ලාභයටත් ගැටගසා ඇත්තේ ඒ නිසාය.

ජාත්‍යන්තර කම්කරු පන්තිය අද දිනයේ මුහුනදී සිටින තත්ත්වය, දශක ගනනාවක් තිස්සේ වෘත්තීය සමිති විසින් කරන ලද පාවාදීමේ උරුමයයි. 1960 හා 1970 ගනන් වල පැන නැඟි විප්ලවකාරී නැඟිටීම් මැඩ, පාලනය කිරීමෙන් අනතුරුව ධනපති පන්තිය ප්‍රහාරාත්මක ගමනක යෙදුනි. එක්සත් ජනපද ජනාධිපති විසින් 1981 දී පැට්කෝ ගුවන් ගමන් පාලක වරුන් රැකියාවලින් නෙරපා හැරීමට සමානුපාතිකව ජනාධිපති ජේ ආර් ජයවර්ධන දිවයින ලාභ ශ්‍රම වේදිකාවක් බවට පත්කිරීමේ ඔහුගේ සැලසුමට එරෙහිව නැඟී සිටි රාජ්‍ය අංශයේ ලක්ෂයකට අධික කම්කරුවන් රැකියා වලින් පහකලේය. එක්සත් ජනපදයේදී ඒඑෆ්එල්-සීඅයිඕ වෘත්තීය සමිති මෙන්ම මෙරට සමිති ද ජයවර්ධනට සිය වෙලඳපොල ගැති න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසමින් විරෝධතා මැඩපැවැත්වීමෙහිලා උපකාරී විය.

එක්සත් ජනපදයේදී මෙන්ම ශ්‍රී ලංකාවේ පාවාදීම ද දුරදිග යන ප්‍රතිවිපාක ගැබ්කර ගත්තේය. වතුකරය ද ඇතුලුව රාජ්‍ය සේවාවන් හා ව්‍යවසායන් පුද්ගලීකරනය කරමින් ජයවර්ධන, කම්කරු පන්තියට එරෙහිව ප්‍රහාරාත්මක ගමනක යෙදුනේය. ගැඹුරට මුල් බැසගත් විරුද්ධත්වය හා කෝපය හමුවේ ජයවර්ධන, කම්කරු පන්තිය බෙදීම සඳහා, සියවස් කාලක ව්‍යසනකාරී සිවිල් යුද්ධයට ද 1983 ලේවැකි දෙමල විරෝධී ජනඝාතන වලට ද තුඩුදුන් වාර්ගික දේශපාලනය තුලට, දේශපාලඥයන් බිලිබා ගැනීමේ උත්සාහයක නිරත විය. වතුකරයේදී සීඩබ්ලිව්සී සිදුකල නින්දිත පාවාදීම්, තමන් වඩාත් සටන්කාමී යයි කියාගත් වෘත්තීය සමිති පතුරු බිහිකිරීමට මඟ පෑදීය. එහෙත් ඒවා පදනම්වූයේ ද සීඩබ්ලිව්සී මෙන්ම එම දේශපාලන දෘෂ්ටිය හා ක්‍රියාමාර්ගය මත ම ය. වෙනසකට තිබුනේ ඒවා කම්කරුවන් පාවාදීමේදී වඩාත් ද්‍රෝහී ක්‍රියාකලාපයක් ඉටුකිරීම පමනි.

මෙම ක්‍රියාවලීන් අති මූලික වශයෙන් ගෝලීය පරිමානයක් අත්කර ගනියි. ජාතික සුවිශේෂතාවන්ට ඉඩ සලසමින් වුවත් සෑම රටකම කම්කරුවන්ට, ඉමහත් දිරිසුන් භාවයක් හා ව්‍යාකූලත්වයක් වපුරා තිබෙන තමන්ගේම සමිති හා පක්ෂ ගැන කීමට ඇත්තේ එම කථාන්තරයමය. බැල්මොරල් වතුයායේ කම්කරුවන් විසින් ගෙන ඇති ආරම්භකත්වයේ වැදගත්කම පවතින්නේ ඔවුන් ඉදිරි මාවතක් පෙන්වීමට සමත්වීම තුලය. තමන්ගේත් තම පවුල්වලත් යැපීම සඳහා අති මූලික අවශ්‍යතාවන් පවා සුරක්ෂිත කර ගැනීමට නම් ඔවුන්ගේ හාම්පුතුන්ට හා ආන්ඩුවට එරෙහිව පමනක් නොව සියල්ලටත් වඩා වෘත්තීය සමිති වලට එරෙහි කැරැල්ලක අවශ්‍යතාවය ඔවුන් හඳුනාගෙන සිටියි. එසේම ඔවුන්ගේ අරගලය, සමාජය සමාජවාදී ලෙස ප්‍රතිසංවිධානය කල හැකි ප්‍රතිවිරුද්ධ දේශපාලන ක්‍රියාමාර්ගයක් මත පදනම් කලයුතු බව ද ඔවුහු වටහාගෙන සිටිති.

බැල්මොරල් වතුයායේ ක්‍රියාකාරී කමිටුව විසින් නිකුත්කර ඇති ආයාචනය පැහැදිලි ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනයක් මත පදනම් කර තිබීම තීරනාත්මකය. ජාත්‍යන්තරවාදයෙන් අප අදහස්කරන්නේ ජාත්‍යන්තර සහයෝගීතාවය පිලිබඳ පුහු ගෝසාවක් නොවේ. ඒ වෙනුවට ජාතික බෙදීම් ජයගත යුතු බවත් අරගල වඩ වඩාත් ව්‍යාපාරික පොදු සතුරාට එරෙහිව ජාත්‍යන්තරව සංවිධානය කර දියත් කල යුතුය. අන් සියල්ලටත් වඩා එය අර්ථවත් වන්නේ කම්කරුවන් එකිනෙකාට එරෙහිව පිහිටුවීම සඳහා යොදාගනු ලබන සියලු ජාතිකවාදයන්,

ආරක්ෂනවාදයන් හා වර්ගවාදයන්ට එරෙහි දේශපාල අරගලයක් ලෙසය.

ශ්‍රී ලංකාවේ බලයට පත් ආන්ඩු 26 වසරකටත් වැඩි කාලයක් තිස්සේ සිය දෙමල විරෝධී යුද්ධය පවත්වාගෙන ගොස් ඇත්තේ අවිශ්වාසයේ හා සැක සාංකාවන්ගේ බිහිසුනු සලකුනු ඉතිරිකොට තබමින්ය. යුද්ධයට හා ආන්ඩුවේ වාර්ගික ප්‍රචාරනයට විරුද්ධ වීම කෙසේ වෙතත් වෘත්තීය සමිති විවිධාකාරයෙන් ක්‍රියාත්මක වී ඇත්තේ යුද ව්‍යායාමයට හරස්කපන්නේ යයි විවේචන එල්ලවූ සෑම අවස්ථාවකම විරෝධතා හා වැඩ වර්ජන නතරකර දැමීමටයි. මෙම තත්ත්වයන් තුල බැල්මොරල් වතුයායේ ක්‍රියාකාරී කමිටුව මෙසේ පැවසීම බෙහෙවින් අර්ථවත්ය. "අපි අපගේ සිංහල පන්ති සහෝදර සහෝදරියන්ට විශේෂ ආයාචනයක් කරන්නෙමු. බොහෝ කාලයක් තිස්සේ ආන්ඩු හා සියලුම සංස්ථාපිත පක්ෂ ඔවුන්ගේ වාර්ගික දේශපාලනය තුලින් අප අතර භේදයක් නිර්මානය කර තිබේ."

තමන් හමුවේ ඇති අනතුරු හා බාධක පිලිබඳව බැල්මොරල් වතු කම්කරුවෝ හොඳින්ම වටහාගෙන සිටිති. හාම්පුතුන්ගේ දඩයම් හා හංවඩු ගැසීම්, පොලිස් ප්‍රකෝපකරන හා මර්දනය, පෙරලිකාර කම්කරුවන්ට එරෙහිව සමිති මැරයන් යොදාගැනීම පිලිබඳ දිගු වාර්තාවක් මෙරට සතුව ඇත. ඔවුන් තමන් ගැනම කියන ආකාරයට "අපට තනිව සටන් කල නොහැකිය." මෙම කම්කරුවන්ට සහාය දක්වන ලෙසත්, සියල්ලටමත් වඩා අවශ්‍ය දේශපාලන පාඩම් උකහා ගනිමින් සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා සටන සියතට ගන්නා ලෙස මෙරට හා ජාත්‍යන්තර කම්කරු පන්තියෙන් සමාජවාදී සමානතා පක්ෂය ඉල්ලා සිටියි.

**විජේ ඩයස්**

© www.wsws.org